# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ජාතික පාරිසරික පර්ෂදය
## (සංස්ථාගත කිරීමේ)

**ජාතික පාරිසරික පර්ෂදය සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අචල ජාගොඩගේ මහතා විසින්
2013 දෙසැම්බර් මස 19 දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 දෙසැම්බර් මස 09 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[278 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි.        තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## ජාතික පාරිසරික පර්ෂදය (සංස්ථාගත කිරීමේ)

### ජාතික පාරිසරික පර්ෂදය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

*පූර්විකාව.*

ජාතික පාරිසරික පර්ෂදය යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පර්ෂදයක්, එකී පර්ෂදයේ සාමාජිකයන් එකඟවී ඇති රීතිවලට අනුකූලව, එකී පර්ෂදයේ අරමුණු හා පරමාර්ථවලට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පර්ෂදය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පර්ෂදය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් ද, එකී පර්ෂදය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉටු කිරීම මහජන යහපතට හේතුවක් හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2013 අංක දරන ජාතික පාරිසරික පර්ෂදය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ජාතික පාරිසරික පර්ෂදය සංස්ථාගත කිරීම.*

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු ‘‘පර්ෂදය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) දැනට ජාතික පාරිසරික පර්ෂදයේ සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ‘‘සංස්ථාව’’ යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පාරිසරික පර්ෂදය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ද ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

*පොදු පරමාර්ථ.*

**3.** සංස්ථාව පිහිටුවීමට හේතු වූ පොදු පරමාර්ථ පහත දැක්වෙන ඒවා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) පාරිසරික ක්ෂේත්‍රයේ දී ලබාගත් ප්‍රගතීන් කලින් කලට සමාලෝචනය කිරීම සහ නිසි ක්‍රියාමාර්ග යෝජනා කිරීම;

(ආ) ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාවය, ගෘහස්ථ අපද්‍රව්‍ය කළමනාකරණය, විකල්ප බලශක්ති ප්‍රභවයන් ජනප්‍රිය කරවීම හා ප්‍රවර්ධනය කිරීම මෙන්ම අඩු වියදම් පාරිසරික සංරක්ෂණ තාක්ෂණයන් හුවමාරු කිරීම හා පහසු කරවීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ ස්වාභාවික, ජීව විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක නොවන සම්පත් සුරැකීම, දේශීය දැනුම සහ තාක්ෂණය, සංස්කෘතිකමය උරුමය ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) තරුණ පරපුර ප්‍රමුඛ කරගනිමින් මහජනතාව අතර පාරිසරික හිතකාමී පුරුදු ප්‍රචලිත කිරීම සහ ඔවුන්ට පාරිසරිකමය ගැටළු සහ ඒවාට ඇති පිළිතුරු පිළිබඳ අධ්‍යාපනයක් ලබා දීම සහ පාරිසරික සංරක්ෂණය පිළිබඳව වැටහීමක් ලබා දීම, ශ්‍රී ලංකාව තුල හඳුනාගනු ලැබූ පාරිසරිකමය ගැටළු සඳහා ප්‍රජා මූලික ක්‍රියාවලීන් අනුගමනය කිරීම ;

(ඉ) පාරිසරිකමය වශයෙන් බලපෑමක් සහිත ව්‍යාපෘතීන් පිළිබඳ ප්‍රතිපත්ති මාර්ගෝපදේශන හා පොදු ක්‍රියාකලාපයන් නිර්දේශ කිරීම, අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඊ) ජාතික හා පළාත් මට්ටමේ ව්‍යාපෘතීන් / වැඩසටහන් සඳහා අවශ්‍යතාවයන් හඳුනාගැනීම සහ තාක්ෂණික සහයෝගීතාවය අවශ්‍ය වන පළාත් හඳුනාගැනීම, පුහුණු කිරීම්, පර්යේෂණ සහ තාක්ෂණික සහාය අවශ්‍ය වන අංශයන් හඳුනාගැනීම, ක්‍රියාත්මක වීම සහ එවැනි වැඩසටහන් සංවිධානය කිරීම ;

(උ) පළාත් තුළ ඇති ස්වේච්ඡා පාරිසරික කණ්ඩායම් පාරිසරික සමූපකාර ජාලයක් ස්ථාපිත කරලීමෙහි දායක් වීම, ඒවාට අවශ්‍ය වන සහාය ලබා දීම සමිතිවල කාර්යමණ්ඩලයන්හි කළමනාකාරීත්වය සහ කාර්යක්ෂමාතාවය නංවාලීමේ පියවරයන් සහ නිර්දේශයන් සැකසීම ;

(ඌ) පළාත් තුළ ඇති සමූපකාර අතර ක්‍රමවත් ලෙස තොරතුරු බෙදා හැරීම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම ප්‍රවර්ධනය කිරීම, පළාත් පාරිසරික සමූපකාර සමිති ප්‍රවර්ධනය සඳහා වූ වේදිකාවක් ලෙස ක්‍රියා කිරීම ;

(එ) පාරිසරික සංරක්ෂණය සඳහා අදාළ සංවිධාන අතර කාර්යක්ෂම සම්බන්ධතාවක් පවත්වා ගැනීම ;

(ඒ) සාමාජිකයන් අතර සහභාගීත්වය වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ජාතික පාරිසරික පර්ෂදය සෑදීමට පාදක වූ පේරාදෙණිය විශ්වවිද්‍යාල හන්තාන සංරක්ෂණ සංගමයට සහාය ලබා දීම ;

(ඔ) විධායක කමිටුවෙහි අරමුණු හා ඉලක්ක ප්‍රවර්ධනය කිරීමෙහිලා බලපාන අනෙකුත් ක්‍රියා කළාපයන් ක්‍රියාත්මක කිරීම ;

සංස්ථාවේ පොදු බලතල.

4. මේ පනතේ සහ වෙනත් කවර හෝ ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් කටයුතු, එනම් :—

(අ) අරමුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම හා දායක මුදල් ඉල්ලා ලබා ගැනීම ;

(ආ) චංචල හෝ නිශ්චල දේපල කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදි කිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස් කිරීම;

(ඇ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාමේ සහ වැසීම හා ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් 05 වන වගන්තිය යටතේ නිසි පරිදි තෝරා පත් කර ගනු ලැබූ විධායක කාරක සභාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීම ;

(ඉ) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට ඇතුළත් වීම ;

(ඊ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීමට හෝ සේවය අවසන් කිරීම හා සංස්ථාව විසින් තීරණය කරනු ලබන වැටුප් දීමනා හා පාරිතෝෂික දීමනා ගෙවීම;

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවට නැංවීම සඳහා ආනුෂංගික වන්නා වූ අවශ්‍ය හෝ අවස්ථානුකූලව අවශ්‍ය වන්නා වූ වෙනත් සියලු දේ කිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය ;

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවල විධිවිධාන සලස්වා තිබෙන පරිදි හා ඒ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගැනුනු නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින් මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) විධායක සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී පර්ෂදයේ විධායක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම විධායක අනුරූප ධුරයන් දරන සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම ;

(ආ) සභාව තෝරා පත්කර ගැනීම, සභාවේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත්හැරීම සහ සභාවේ බලතල, කාර්ය සහ සභාව ක්‍රියා කළ යුතු ආකාරය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය හා ඔවුන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ සේවය අවසන් කිරීම ;

(ඇ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම් කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම් කැඳවීම, පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය ;

(ඉ) සංස්ථාවේ සහ සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපල පරිපාලනය හා කළමනාකරණය ; සහ

(උ) පොදු වශයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලපැවැත්වූ පර්ෂදයේ ව්‍යවස්ථා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තිය යටතේ රීතියක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම රීති මේ වගන්තිය යටතේ රීතිටයක් සාදනු ලබන ආකාරයෙන් මෙන් එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පර්ෂදය විසින් සහ පර්ෂදයට ගෙවිය යුතු ණය..

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පර්ෂදයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පර්ෂදයට ලැබිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව..

**8.** මේ පනත යටතේ හා රීති යටතේ සංස්ථාව විසින් අත්කරගත් හෝ දරනු ලබන සියලුම චංචල හෝ නිශ්චල දේපල සහ සංස්ථාවට ගෙවනු ලබන හෝ සංස්ථාවට ලැබෙන සියළු මුදල් සංස්ථාවේ

පරමාර්ථ ඉදිරියට ගෙනයාම සඳහා රීතිවලට අනුකූලව දැරීම, ප්‍රයෝජනයට ගැනීම හා යෙදවීම කළ යුතු ය. තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් ව, එම දේපල විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම සඳහා පූර්ණ බලය ඇත්තේ ය.

ගිණුම් සහ විගණනය.

**9.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය;

(ආ) සංස්ථාව විසින් සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට සලස්වනු ලැබිය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම්, විධායක සභාව විසින් නම් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** සභාපති සහ ලේකම්වරයාගේ හෝ විධායක සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවේ වෙනත් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී සාමාජිකයන් විසින් ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් සාධන පත්‍රයේ ඔවුන්ගේ නම අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකුගෙන් සංස්ථාවට අයවිය යුතු වාර්ෂික ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගේ හෝ ඔවුන් යටතේ හෝ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.